සුවෙන් පෙරට

e ඉගෙනුම් පියස

මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

ZEOM
කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ
மண்டல கல்வி அலுவலகம் - மினுவாங்கொட
Zonal Education Office - Minuwangoda

| වාරය - දෙවන වාරය | | |
|---|---|---|
| ශ්‍රේණිය : 10 | විෂයය : සිංහල භාෂාව හා සාහිත්‍යය | පාඩම : 9 වන පාඩම.කර්තෘ කාරක වාක්‍ය සහ කර්ම කාරක වාක්‍ය<br>3 වන කොටස : විශේෂ වාක්‍ය රීති |

ඔබට නියමිත පෙළපොතෙහි ඇති වාක්‍ය රීති පිළිබඳ කෙටි සටහනකින් අවධානය යොමු කරමු.

| | වාක්‍ය රීතිය | නිදර්ශනය |
|---|---|---|
| ද්විත්ව උක්තය | වෙයි, විය, වූහ, ආදී ක්‍රියාපද වල මූලය වූ “ ව” ධාතුවෙන් සෑදුණු ක්‍රියා අකර්මක හෙයින් වාක්‍යය සම්පූර්ණ කිරීම සඳහා ආඛ්‍යාත පූරණයක් අවශ්‍යය. එවිට උක්තයත් ආඛ්‍යාත පූරණයත් දෙකම සමාන විභක්ති, වචන, ලිංග බවට පත් වෙයි. | • මම ගුරුවරියක් වෙමි.<br>• වික්‍රමසිංහ ලේඛකයෙක් වේ.<br>• අපි අහිංසකයෝ වෙමු.<br>• ඔවුහු ලාංකිකයෝ වෙති. |
| | ඇතැම් විට “ ව” ධාතුවෙන් සෑදුණු ක්‍රියාව වෙනුවට වාක්‍යාවසාන “ ය ” හෝ “යි ”නිපාතය යෙදේ. එහෙත් රීතිය එසේ ම වේ. | • ඔහු නීතිඥයෙක් ය.<br>• ඔවුහු අහිංසකයෝ ය.<br>• රෝගීහු අසරණයෝ ය. /යි<br>• අපි නීතිගරුක පුරවැසියෝ ය /යි |
| | ඇතැම් විට “ව” ධාතුවෙන් සෑදුණු ක්‍රියාව නැතිව ප්‍රශ්නාර්ථ නිපාතය යෙදේ. එහෙත් රීතිය එයම වේ. | • නුඹලා සිංහලයෝ ද ?<br>• ඔවුහු මාධ්‍යවේදී හු ද ?<br>• ඔහු ලේඛකයෙක් ද ? |
| | ඇසූ බව දැක්වෙන අර්ථ සහිත “ ලු ” නිපාතයෙන් අවසන් වන වාක්‍ය සඳහා ද මේ රීතිය ම යෙදේ.<br><br>ඇතැම්විට ඉහත වාක්‍ය ආඛ්‍යාතයක් රහිතව ද යෙදේ. | • දරුවෝ අනාගත පුරවැසියෝ ලු.<br>• ඔවුහු සතුරෝ ලු.<br>• ඔහු හොරෙක් ලු.<br><br>• ඔහු ලේඛකයෙක්.<br>නුඹලා අනාගත නායකයෝ<br>• අපි ශ්‍රී ලාංකික පුරවැසියෝ |
| දෙන/දෙනා යන පද හා බැඳුණු උක්ත පද | උක්තය හා බැඳුණ දෙන/දෙනා යන පද ද උක්ත ස්වරූපයෙන් තබනු ලැබේ. | • ළමයි දෙදෙනෙක් පන්තියට පැමිණියහ. |
| තෙමේ,තොමෝ තුමූ පද උක්තය වශයෙන් යෙදීම | “තෙමේ ” පුරුෂ ලිංග ඒකවචන පදයකි.<br>“තොමෝ” ස්ත්‍රී ලිංග ඒකවචන පදයකි.<br>මේ පද දෙකේ ම බහුවචනය “තුමූ ” යන්නයි. වචන භේදයට අනුව ආඛ්‍යාතය තබනු ලැබේ. | • ඒ තෙමේ මෙසේ පැවසුවේ ය.<br>• ඕ තොමෝ පැවිදි වූවා ය.<br>• ඔවුහු තුමූ ගමට ගියහ. |
| | | |

| | | |
|---|---|---|
| ප්‍රශ්නාර්ථවාචී පද වලින් අවසන් වන වාක්‍යවල උක්තය | • ඇයි? , කෙසේද? කෝ? කවුද?, මොනවා ද ?, ආදී ප්‍රශ්නාර්ථ යොදා සැදෙන වාක්‍යවල කර්තෘ උක්ත ස්වරූපයෙන් ම යෙදිය යුතු ය.<br>• එහෙත් එම ප්‍රශ්නාර්ථවාචී පදයට පෙර කෘදන්ත පදයක් හෝ නිපාත පදයක් යෙදුනහොත් කර්තෘ අනුක්ත වේ. | • ඔවුහු සේවකයෝ ද ?<br>• නුඹ කවුරු ද ?<br>• පන්තියේ ළමයි කෝ ?<br>• ඔවුන් එන්නේ ඇයි ?<br>• දක්ෂ ළමයෙකු වන්නේ කෙසේද ?<br>• ඔවුන් එන්නේ කවරදා ද ?<br>• සංගමයේ සාමාජිකයන් බලාපොරොත්තු වන්නේ මොනවාද ? |
| ඇත, නැත පදවලින් අවසන් වන වාක්‍යවල උක්තය | • වාක්‍යයක ආඛ්‍යාතය යෙදෙන තැන ඇත, නැත, යන ක්‍රියාව යෙදුණහොත් කර්තෘ උක්ත ස්වරූපයෙන් ම යෙදේ. | • ඒ ළමයා එතරම් දක්ෂ නැත.<br>• ඔහු මීට කැමති නැත.<br>• මම මීට සම්බන්ධ නැත. |
| | • එහෙත් ඇත, නැත, ක්‍රියාපදවලට මුලින් පූර්ව ක්‍රියාවක් හෝ කෘදන්ත පදයක් යෙදුනහොත් කර්තෘ අනුක්ත වේ. | • පාසලට ගුරුවරුන් පැමිණ නැත.<br>• පන්තියට ළමයින් ඇවිත් නැත.<br>• ඒ වනයේ මිනිසුන් සිටින්නට ඇත. |
| | • ඇත, නැත යන පද ඇත්තෙමි, ඇත්තෙමු, ඇත්තාහ ආදී වශයෙන් වර නැඟී යෙදෙන කල කර්තෘ උක්ත ස්වරූප ගනී. | • මම නවකතාව කියවා ඇත්තෙමි.<br>• ඔවුහු කවි ගී ලියා ඇත්තාහ.<br>• අපි සත්‍ය පවසා ඇත්තෙමු. |
| යුතු , හැකි, මැනවි, වටී ආදී පදයකින් අවසන් වන වාක්‍යවල උක්තය | • වාක්‍යයක කෘදන්ත නාමයකට පසුව යුතු, හැකි, මැනවි, වටී ආදියෙන් යෙදුන හොත් කර්තෘ අනුක්ත වේ. | • මිනිසුන් වෙහෙස වී වැඩ කළ යුතු ය.<br>• දරුවන් දෙගුරුන්ට ගරු කළ යුතු ය.<br>• අප ගුරුවරුන්ට ගරු කිරීම වටී. |

## ස්වයං අභ්‍යාස අංක 01

01. ඔවුන් සතුරන් බව දන්නේ නම්,.................. එතැනට යන්නේ නැත . ( අපි / අප )

02. .............. ............ ඉදිරිපෙළ අසුන පූජ්‍ය පක්ෂයට දීම මැනවි. ( මගීන් / මගීහු )

03. දක්ෂ ,............. වන්නේ කෙසේ ද ? ( ළමයෙක්/ ළමයෙකු )

04. අපි සියලු දෙනා ම ශ්‍රී ............................... වෙමු. ( ලාංකිකයන්/ ලාංකිකයෝ )

05.………………… සියලු දෙනාම නිදහස් වූහ . ( සැකකරුවන් / සැකකරුවෝ )

06. කුමාරතුංග මුනිදාස මහතා දක්ෂ ලේඛකයෙකු මෙන්ම…………………… ද වේ.

07. ( විචාරකයෙක්/ විචාරකයෙකු )

08. විභාගය සමත් වන්නෝ …………………………… ය . ( දක්ෂයෝ/ දක්ෂයන් )

09. සභා ……………. සතුටින් විසිර ගියා ය. ( තොමෝ/ තුමු )

10. පාසලට ආවේණික සංස්කෘතියක් ඇති බව ……………………වටහා ගැනීම වටී යැයි විදුහල්පතිතුමා පැවසී ය. ( ළමයින්/ ළමයි )

11. මැනවින් ශිල්ප උගන්වන්නෝ සැමදා පින් රැස් ……………. වෙති. ( කරන්නෝ/ කරන්නන් )

**ස්වයං අභ්‍යාස අංක 02.**

පෙළපොතේ ඇති වාක්‍ය රීති අධ්‍යයනය කර පහත ඉදිරිපත් කරන එක් එක් වාක්‍යය අයත් වන රීතිය කුමක්දැයි ලියන්න.

01. ගමේ ජීවත් වන මිතුරෝ අපේ සහෝදරයෝ ද වෙති.
.රීතිය ………………………………………………………………

02. ඔහු සුප්‍රකට ගායකයෙක් ය./ ගායකයෙකි.
රීතිය : ………………………………………………………………

03. සමිතියේ නව ලේකම්තුමා රජයේ නිලධාරියෙක් ද ?
රීතිය : ………………………………………………………………

04. දුටුගැමුණු රජතුමා දැහැමි පාලකයෙක් ලු.

රීතිය ………………………………………………………………

05. මිනිස්සු දෙදෙනෙක් බැම්ම ඉදි කළහ.
රීතිය ………………………………………………………………

06. ශ්‍රී ලාංකේය ගොවියන් ඉදිරි කන්නයේ බලාපොරොත්තු වන්නේ මොනවා ද ?
රීතිය ………………………………………………………………

07. සියලු ශිෂ්‍යයන් කඩිසර ව වැඩ කිරීම මැනවි.
රීතිය………………………………………………………………

08. පයින් යන්නෝ මාර්ගයේ දකුණු පසින් ගමන් කළ යුත්තාහ.
රීතිය ………………………………………………………………

09. මම එහි ගොස් ඇත්තෙමි.
රීතිය ………………………………………………………………

10. සභාතොමෝ සතුටින් විසිර ගියා ය

රීතිය ………………………………………………………………